# පුංචි අපිට සිංහල 5



## 'ළ' යොදන හැටි

**ජේ. බී. දිසානායක**


චිත්‍ර

ප්‍රශිත් අබේසිරි


(C) Sumitha Publishers



මගේ නම

..................................................................................................

# මූර්ධජ ළ-යන්න

## හැඳින්වීම

සිංහල අක්ෂර මාලාවෙහි එන අකුරු දෙකක් හැඳින්වෙන්නේ පහත දැක්වෙන නම්වලිනි.

දන්තජ ල

මූර්ධජ ළ

ඉස්සර කාලයෙහි මේ අකුරු දෙක කියෙව්වේ වෙනස් ශබ්ද දෙකක් හැටියට ය. ඒ වුණත් අද මේ ශබ්ද දෙක කියවෙන්නේ එක ම විදියට ය. 'මල' හා 'මළ' යන පද දෙක අද සිංහල අපේ කටින් පිට වන්නේ එක ම හඬක් හැටියට ය. ඔබ පහත දැක්වෙන කියුම් කියවා බලන්න. ල-යන්න හා ළ-යන්න යන අකුරු දෙක ම කියවෙන්නේ එක ම හඬින් නේ ද ?

(C) Sumitha Publishers

මල — මල පිපෙනවා
පිච්ච මල
පුවක් මල

මළ — මළ ගෙදර
මළ මිනිය
මළ බත්

කතා කරන විට මේ අකුරු දෙක ම කියවෙන්නේ එක ම විදියට වුණත් ලියන විට ඒ අකුරු වෙන් වෙන් වශයෙන් ලිවීම සිංහල ලේඛකයන්ගේ සිරිත යි. ඒ නිසා ල-යන්න යෙදෙන පදත් ළ-යන්න යෙදෙන පදත් වෙන් වෙන් වශයෙන් ඉගෙන ගැනීම වැදගත් ය. මේ පෙතේ අරමුණ ළ-යන්න යෙදෙන පද සමහරක් උදාහරණ ඇතිව හඳුන්වා දීම යි. ඒ ඒ පද ගායනා කිරීමට පුළුවන් විදියට කවියට නඟා ඇත. එවිට ඒ පද ලේසියෙන් මතක තබා ගැනීමට හැකි වනු ඇත.

පුංචි ඔබත් මේ පද නිවැරදිව ලියන හැටි ඉගෙන ගෙන හොඳ ලේඛකයෙක් වන්න.

# ළ

# ඇළ ළඟ ළිඳ

අවුරුදු නිවාඩුව දැන් ළඟ ළඟ එනවා
ළමා ළපටි වන ළැහැබට එක් වෙනවා
වන ළැහැබේ ඇළ ළඟ ඇත්තේය ළිඳක්
කළයක් රැගෙන එනවා ළිඳ ළඟට ළඳක්



(C) Sumitha Publishers

පිරුණත් වතුර නිතර ම ළිං කට ළඟ ට
ළිං මැඩියෝ කෙළිමින් රිංගති යට ට
පොත් පත් නොකියවන සමහර ළමයින් ට
උපමාවක් ය සම කර ළිං මැඩියන් ට



# ළිප ළඟ හෙළ සිරිත්



හෙළ අවුරුදු එන වා
ළිප ම අලුත් වෙන වා
ළිප් බැඳ ගිනි මොළ වා
හෙළ සිරිතට කන වා



(C) Sumitha Publishers



කළ ගෙඩි ළිප ළඟ ඇ ති
ළන්දු ළිඳට ගෙන ය ති
පුරවා ගෙන කළ ගෙ ඩි
සුව දිවි ළං කර ග ති



# ඇළ දොළ පොළ හා කුළ



ඇළට ඇළක් නැත
මෙහෙම ඇළක් නැත
කොළඹට ළඟ ජා ඇළ වාගේ



දොළට දොළක් නැත
මෙහෙම දොළක් නැත
පිළියන්දළ මහ දොළ වාගේ

(C) Sumitha Publishers



පොළට පොළක් නැත
මෙහෙම පොළක් නැත
ගම්පොළ ඉරිදා පොළ වාගේ



කුළට කුළක් නැත
මෙහෙම කුළක් නැත
සිරිපා සමනළ කුළ වාගේ